නමෝ බුද්ධාය

ශ්‍රී සම්බුද්ධ ශාසනේ

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 201

ශ්‍රී. බු. ව. 2560 | 2017 මාර්තු 12 | මැදින් කළාපය

# නිමි රජු දුටු නිරයන් හා එහි යෑමට හේතු වන කරුණු

## අති පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ නාහිමිපාණන් විසිනි

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

ඉක්බිති මාතලී දෙව්පුත් නිමි මහ රජතුමාට අන් නරකයක් දක්වන ලදි. එහි ඇති මළ මුත්‍රා පිරුණු අතිශයින් දුර්ගන්ධ වූ අසූචි විල ගිනිගෙන දුම් දමමින් පැසෙන්නේ ය. සාදුකින් පෙලෙන නිරි සත්වයෝ ඒ කුස ගිනි වේදනා ඉවසා ගත නො හැකිව දුම් දමමින් පැසෙන ඒ අසූචි ගුලි ලෙස පිඩු කොට ගෙන අනුභව කරති. මෙය දුටු නිමි රජු මේ සත්වයන් මනුලොව දී කිනම් පව් කලාහු දැයි මාතලී දිව්‍ය රියදුරුගෙන් ඇසූ විට හෙතෙම මෙසේ කීවේය.

ඒ අනුව යම් සත්වයෙක් අත්පා කැපීම් ආදී වශයෙන් මිනිසුන්හට දරුණු වධ දෙන්නෝ ද මිතුරන් වෙහෙසන්නෝ ද අනුන්ට හිංසා පීඩා කරන්නෝ ද අනුන්ගේ ගෙයි ආහාරපාන අනුභව කොට පනවන ලද අසුන්වල ම නිදා පසුව ඒ උපකාර කළ මිතුරන් ගේ ධනය පැහැර ගන්නා වූ ඔවුන්ගෙන් අල්ලස් ගන්නා වූ මිත්‍ර ද්‍රෝහි වූ ද මේ නිරයෙහි ඉපිද ගිනියම් වූ අසූචි අනුභව කරත් යැ යි. මාතලී දෙව්පුත් කියා ඇති බව අටුවාවට ද අනුව අර්ථ දත යුතුය.

ඉක්බිති නිමි මහ රජතුමාට අනු නරකයක් පෙන්වන ලදී. එහි කුණු ලේ සැරව පිරුණු අතිශයින් දුර්ගන්ධ වාහනය වන අපවිත්‍ර විලක් ඇත. ගිනි රශ්මියෙන් අතිශයින් ම පෙලෙන නිරි සතුන් ඉන් පිපාසිතව බීමට පැන් නැතිව මේ කුණු වූ අපවිත්‍ර ලේ සැරව පානය කරති. මෙය දුටු නිමි රජු ඔවුන් කිනම් පව් කම් කලාහුදැයි විමසීය. එහි දී මාතලී දෙව් පුත් ඒ කරුණ මෙසේ පහදා දෙන ලදි.

ඒ අනුව යමෙක් මව හෝ පියා හෝ රහතුන් හෝ මරා ගිහි පරාජිකාවන්ට පත්වූවෝද පූජා සත්කාරයට සුදුසු වූ සිල්වත් ගුණවත් බුද්ධ ශ්‍රාවකයෝ නැසූ පව්කාරයෝ ද මෙහි ඉපිද ලේ සැරව අනුභව කරන්නෝ වෙති යැ යි මාතලී දෙව්පුත් කී බව අටුවාවට ද අනුව අර්ථ දත යුතුය.

ඉක්බිති නිමි මහ රජතුමාට අන් නරකයක් පෙන්වන ලදි. එහි යම පල්ලන් විසින් උපන් නිරි සතුන්ගේ දිව ගිනියම් වූ බිලී කොකු වලින් අමුනා ඇද ගිනියම් වූ යම පොළොවෙහි හෙළා ගව හමක් ඇද උල් ගහන්නාක් මෙන් උල් ගසත් නිරි සත්වයෝ ගොඩ දැමූ මසුන් මෙන් දුක් ඉවසා ගත නොහැකිව හඩමින් කෙළ වගුරුවත්. මෙය දුටු නිමි රජු බියපත් වී කිනම් පව් කළාහු මෙහි වැටී දුක් විඳිත් දැයි මාතලී රියදුරු ගෙන් අසන ලදි. එහිදී මාතලී දෙව් පුත් මෙසේ කීවේය.

ඒ අනුව බඩු මිල නියම කර ස්ථානයෙ හි ඒ ඒ භාණ්ඩයේ අගය නියම කිරීම් වශයෙන් හෙවත් මිල ප්‍රමාණ කිරීම් වශයෙන් නියුතුව සිටින පුද්ගලයෙක් භාණ්ඩ ගන්නට සිටින පුද්ගලයන් ගෙන් අල්ලස් ගෙන වටිනා භාණ්ඩයේ මිල පහත හෙලන කෛරාටිකයෝ ද ඇමෙන් වැසූ බිලීකොක්ක රැගෙන මසකු මරන්නා සේ හොර කිරුම් මිනුම් ආදී කූඨ ක්‍රියා කරන නිව වෙළෙන්දෝ ද මෙහි ඉපිද ගිනියම් වූ බිලී අමුණන ලදුව ගිනියම් වූ යම පොළවෙහි නිදත් යැ යි පවසන ලද බව අටුවාවට ද අනුව අර්ථ දත යුතු ය.

ඉක්බිති මාතලී දෙව්පුත් තෙමේ නිමි මහ රජතුමාට අන් නරකයක් පෙන්වන ලදි. එහි යමපල්ලන් විසින් කැපූ ශරීර ඇති පිළිකුල් ස්ත්‍රී හු හිස අත බැඳගෙන හඩති. ගෙල සිඳී ගවයන් මෙන් ලේ සැරව තැවරුණු ශරීර ඇතිව ගිනියම් වූ යම පොළොවෙ හි ඉගටිය තෙක් එරී සිටුවන ලද කණු මෙන් සිටිති. එහිදී එක් එක් දිශා වලින් ගිනියම් වූ යකඩ පර්වත හෙන ගහන්නාක් මෙන් ශබ්ද නංවමින් නැගී අවුත් ඔවුන්ගේ ශරීර සුණු විසුණු වී එකෙනෙහි ම කර්ම බලයෙන් නැවතත් ශරීරය තිබූ අයුරින්ම පහළ වෙති. ගිනියම් වූ පර්වත ද නැවත නැවත ඔවුන්ගේ ශරීර සුණු විසුණු කරත් ම ය. විටක ගිනියම් වූ පර්වත දෙකක් දෙපසින් විත් උක්ගස් අඹරාන්නාක් මෙන් පෙලෙත් ඉතා රත් වූ ලේ වැගිරෙති. කිසියම් විටක පර්වත තුන හතරක් ද විත් මෙසේ ම පෙලෙති. මෙය දුටු නිමි රජු බියපත්ව මාතලීය, මොවුන් කිනම් පව් කළාහු දැයි විචාළේය. එහිදී මාතලී දෙව්පුත් තෙමේ මෙසේ කිවේය.

ඒ අනුව අපිරිසිදු ක්‍රියා ඇති සමහර කුල ස්ත්‍රී හු අසංයත ධූර්තිකාවන් මෙන් ආහාර පාන වස්ත්‍රාභරණ සපයා දීමෙන් තමන් පෝෂණය කරන

හිමියන් හැර පර පුරුෂයන් සතුටු කරවන්නා වූ ඔවුන් හා සිත් පරිදි කම්රතියෙහි හැසිරෙන පාප ස්ත්‍රී හූ මේ නිරයට පැමිණ ගිණියම් වූ යම පොළොවෙහි ගිනිදැල් සහිත පර්වත වලින් ඇඹරෙති යැ යි කියා ඇති බව අටුවාවට ද අනුව අර්ථ දත යුතුය.

ඉක්බිති මාතලී දෙව්පුත් තෙමේ නිමි මහ රජතුමාට අන් නරකයක් පෙන්වන ලදි. එහි දිලිසෙන බියකරු ගිනි අඟුරු පිරුණු මහ හරා වලකි. එය දැක නිරි සතුන් එහි පිවිසීමට බියව සිටින විට ගාලට නො පිවිසෙන හරකුන්ට මෙන් යමපල්ලන් විසින් නොයෙක් ආයුධ ගෙන විදිමින් තලමින් ඒ අඟුරු වල කරා ගෙන ගොස් නිරි සතුන්ගේ පා වලින් ගෙන හිස යටිකුරුව සිටිනසේ ඒ බියකරු ගිනි අඟුරු වලේ හෙලත්, එහි ගිලෙන්නාවූ නිරි සතුන් දුටු නිමි මහ රජතුමා බියපත්ව මොවුන් මේ තාක් මහත් දුකට පත්වන්නට කිනම් පව්කම් කළා හූ දැයි විචාලේ ය. එහි දී මාතලී තෙමේ මෙසේ කීවේය.

ඒ අනුව මිනිස් ලොව මිනිසුන්ගේ උත්තම භාණ්ඩයක් වූ ඉතාම ඇලුම් කරන ප්‍රිය භාර්යාවන් හා යම් පුරුෂයෙක් පරදාර සේවනයේ යෙදෙද් ද ඒ පාපී පුරුෂයෝ මෙහිදී දෙපාවලින් ගෙන හිස පහලට සිටින සේ අඟුරු වළට හෙලනු ලැබෙත් යැ යි කී බව කෙටියෙන් දත යුතුය.

ඉක්බිති නිමි මහ රජතුමාට දෙව්පුත් විසින් අන් නරකයන් පෙන්වන ලදි. ඒ නිරියෙහි කුඩා මහත් දුක්ගැහැට ඇති අතර යමපල්ලන් බිම පෙරලා උල් ගැසීම, හරස් කියතින් ශරීරය කැපීම, වෑයෙන් කැපීම, ලෝ දිය පෙවීම, ලෝහ ගුලි කැවීම, ආදී අනේක දුක් දෙයි.(රේරුකානේ චන්දවිමල මහා නා හිමිගේ - චත්තාලිසාකාර මහා විපස්සනා භාවනාව යන ධර්ම ග්‍රන්ථයෙහි දක්වා ඇත) මෙහි නිරි සතුන් තියුණු රළු කටුක දුක් වේදනා විඳිති. නිමි රජ මෙය දැක බියට පත්ව මොවුහු කිනම් පව් කළාහු දැ යි මාතලී රියදුරුගෙන් විමසී ය. හෙතෙම මෙසේ කීවේ ය.

ඒ අනුව මෙලොවක් නැත, පරලොවක් නැත, දී මෙහි විපාක නැත, මව්පියන්ට උපස්ථා කළාට වැඩක් නැත, යනාදී ලෙස කර්ම ඵල විශ්වාස නො කරමින් මිසදිටු ගෙන තමාද මෝහයෙන් නොයෙක් පව්කම් කොට අනයයන්ට ද මිසදිටු අදහස් දී ඔවුන්ද මුලා කරන අධම පව්කාරයන් මෙහි ඉපිද තියුණු රළු කටුක දුක් වේදනා විඳිත් යැ යි කියා ඇති බව දත යුතුය.

මේ අතර දෙව්ලොව දෙවියෝ ද සුධර්මා දෙව් සභාවේ රැස්ව නිමි මහ රජ මාතලී රථාචාර්යා හා පැමිණෙන තුරු මග බලා සිටිති. සක් දෙවිඳු මාතලී දෙව්පුත් ප්‍රමාද කුමක් නිසාද කියා බලනුයේ මේ කරුණ දැක මෙසේ

සිතුවේ ය. මාතලී දෙව් පුත් නිමි රජුට අසචල් කර්මය කොට අසචල් නිරයෙහි පැසෙත් යැ යි කියමින් නරකයන් දක්වමින් හැසිරෙයි. නිමි රසද්සෙදා් පණ ආයු බියේථනහිරය දස්සනස්ස පරියන්තං ගච්ජෙය්‍යාති ඉදින් නිමි රජුගේ ආයුෂ ගෙවුනේ නමුදු නිරයන් දැකීම කෙළවරකට නම් නො යන්නේ යැයි රජුන් සමග වහා එන් යැයි දිව්‍ය පුත්‍රයෙක් අත පණිවිඩයක් යැව් ය. එය ඇසු මාතලී දෙව් පුත් (ගුවනට නැංවූ අහස් යානයක සිට නගරයක සිරි නරඹන්නාක් මෙන් ) එක පාරටම සතර දිශාවල බොහෝ නිරයෝ දක්වා මෙසේ කිවේය.

මහරජ්, පව් කම් කල සතුන් වසන තැන් ද දරුණු පව්කම් කළ සතුන්ගේ උප්පත්ති ස්ථානයෝ ද දුශ්සීල සත්වයන් උපදනා ස්ථානයෝ ද ඔබ විසින් දක්නා ලදහ. දේවයන් වහන්ස! දැන් සක් දෙව් රජුගේ දිව්‍ය සම්පත් දක්නා පිණිස යනු මැනව් යැ යි මාතලී දෙව් පුත් කිවේය. පසුව මෙසේම එහි දෙව් විමන් බලමින් ගිය බව නිමි ජාතකයේ දැක්වේ.

මේ ඉහත දැක්වූ නිරයන් හී ඉපදීමට හේතුවන යම් පවක් කලේ නම් එය චුත වන මොහොතේ සිහි වුවහොත් එම නිරයන් හී ඉපදී දුක් විදීමට සිදුවේ. පසුව එයින් මිදී තිරිසන් සතුන් වී ඉපිද අපමණ දුක් ගැහැට විදීමට සිදුවේ. තිරිසන් ලෝකයේ ඇති දුක ටිකක් හෝ ඔබට පෙනෙන බැවින් මෙහි එය විස්තර නොකරන්නෙමු. ඉන්පසු ශේෂ කර්ම විපාක ලෙස ප්‍රේත ලෝක වලද ඉපදී අපමණ දුක් විදීමට සිදුවේ.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**